# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2186/25 - 2020 ජූලි මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2020.07.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඊ ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 154 ඇ ව්‍යවස්ථාව යටතේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19 (5) වගන්තිය යටතේ සාදන රීති.**

බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර රොෂාන් ගුණතිලක වන මා, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඊ ව්‍යවස්ථාව සමග කියවිය යුතු 154 ඇ ව්‍යවස්ථාව යටතේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19 (5) උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලද, "බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ රීති" මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන බව නිවේදනය කරමි.

**රොෂාන් ගුණතිලක,**  
ආර්ඩබ්පී ඇන්ඩ් බාර් වීඑස්වී යූඑස්පී  
පීඑච්ඩී (ගෞරව) එෆ්අයිඑම් (ශ්‍රී ලංකා) එන්ඩීසී පීඑස්සී,  
මාර්ෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර් ෆෝස්,  
ආණ්ඩුකාරවර,  
බස්නාහිර පළාත,

වර්ෂ 2020 ක් වූ ජූලි මස 30 වැනි දින,  
බත්තරමුල්ල,  
බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි,  
බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

### රීති.

01. මෙම රීති බස්නාහිර පළාත් සභා අරමුදලට හා බස්නාහිර පළාත් සභා අරමුදලින් මුදල් විසර්ජනය වන ව්‍යවස්ථාපිත අධිකාරීන්හි ප්‍රසම්පාදන කටයුතු විධිමත් කිරීම සඳහාත්, බස්නාහිර පළාත් සභාවේ අරමුදලට අදාළව සිදුවන ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිද භාවය වැඩිදියුණු කිරීම සඳහාත්, ප්‍රමාදයකින් තොරව පළාත් ජනතාව සඳහා වඩාත් වාසිදායක හා ධනාත්මක ප්‍රසම්පාදනයක් සැලසීම වෙනුවෙන් මෙම රීති පනවනු ලබයි.


1A - PG 5078— 77 (2020/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

02. මෙම රීති බස්නාහිර පළාත් අරමුදලට අදාළ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ රීති යනුවෙන් හැඳින්වේ.

03. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙහි ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් වන නියමයන්, මාර්ගෝපදේශයන් ඊට අදාළව කලින් කල කරනු ලබන සංශෝධනයන් මෙම රීති යටතේ සඳහන් විධිවිධානයන්ට යටත්ව සහ කලින් කලට ආණ්ඩුකාරවරයා විසින් පිළිගනු ලබන මද වෙනස්කම් සහිතව බස්නාහිර පළාත් සභා අරමුදලට හා ඒ අරමුදලින් මුදල් විසර්ජනය වන ව්‍යවස්ථාපිත අධිකාරීවලට අදාළ අරමුදල් යටතේ කරනු ලබන ප්‍රසම්පාදනයන්ට අදාළ විය යුතු බවට මෙයින් නියම කරමි.

04. (1) බස්නාහිර පළාත් සභා අරමුදලට ආදාළව හා බස්නාහිර පළාත් සභා අරමුදලින් මුදල් විසර්ජනය වන බස්නාහිර පළාත් සභාව යටතේ වූ ව්‍යවස්ථාපිත අධිකාරීන් යටතේ ප්‍රසම්පාදනයට අදාළව ක්‍රියාත්මක විය යුතු ප්‍රසම්පාදන කමිටු සහ ඒ එක් එක් කමිටුව වෙත ඒ සඳහා වන අධිකාරී බලය පිරිනැමීම පහත සඳහන් ආකාරයට විය යුතුය.

| | ප්‍රසම්පාදන කමිටු වර්ගය | අධිකාරී බලය පිරිනැමීම |
|---|---|---|
| අ. | බස්නාහිර පළාත් අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුව | බස්නාහිර පළාත් අමාත්‍ය මණ්ඩලය |
| ආ. | ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව | බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් |
| ඇ. | අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි |
| ඈ. | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි |
| ඉ. | ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි |
| ඊ. | ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව | ගණන් දීමේ නිලධාරී |

(2) බස්නාහිර පළාත් සභා ඉංජිනේරු විෂය භාර නියෝජ්‍ය ප්‍රධාන ලේකම්ගේ කාර්යය කටයුතු පහසු වනු පිණිස ප්‍රධාන ලේකම් විසින් පවරන ලද අධිකාරී බලය මත පහත සඳහන් ප්‍රසම්පාදන කමිටු ක්‍රියාත්මක විය හැකිය.

| | ප්‍රසම්පාදන කමිටු වර්ගය | අධිකාරී බලය ක්‍රියාත්මක කිරීම |
|---|---|---|
| අ. | ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව | බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් |
| ආ. | ඉංජිනේරු විෂයභාර නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව | බස්නාහිර පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| ඇ. | ගොඩනැගිලි අධ්‍යක්ෂක ප්‍රසම්පාදන කමිටුව | බස්නාහිර පළාත් ගොඩනැගිලි අධ්‍යක්ෂ |
| ඈ. | ප්‍රාදේශීය ඉංජිනේරු ප්‍රසම්පාදන කමිටුව | බස්නාහිර පළාත් ගොඩනැගිලි අධ්‍යක්ෂ |

(3) ඉහත (1) වන උපවගන්තිය යටතේ සඳහන් ප්‍රසම්පාදන කමිටු අතරින් අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුව හැර සෙසු සියලුම ප්‍රසම්පාදන කමිටු පත් කිරීම බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු ය.

(4) ඉහත (2) වන උපවගන්තිය යටතේ සඳහන් ප්‍රසම්පාදන කමිටු අතරින් බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව, ප්‍රධාන ලේකම් විසින්ම පත්කළ යුතු අතර, සෙසු ප්‍රසම්පාදන කමිටු පත්කිරීමේ දී බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ එකඟතාවය ඇතිව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් සිදුකළ යුතුය.

(5) බස්නාහිර පළාත් සභාව විසින් පනවන ලද ප්‍රඥප්ති යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත අධිකාරීත්වයක් යටතේ පත්වන ප්‍රසම්පාදන කමිටු ඉහත (1) උපවගන්තිය යටතේ පත්කරන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවකට හා අවස්ථාවෝචිත පරිදි පත් කරන ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවකට අනුරූපී වෙමින් ක්‍රියාත්මක විය යුතුය.

05. ප්‍රසම්පාදනයට අදාළ සෑම ප්‍රසම්පාදන ආස්ථිත්වයක් විසින්ම පූර්ව ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළ වන අවශ්‍යතා හඳුනා ගැනීම, සැළසුම් කිරීම, පිරිවිතර සකස් කිරීම, ලංසු කැඳවීම සහ කොන්ත්‍රාත් ප්‍රදානය දක්වා ක්‍රියාවලිය ඒ ඒ ආස්ථිත්වය යටතේ වූ පාලන ඒකකය යටතේ ද, කොන්ත්‍රාත් ප්‍රදානය සිට කොන්ත්‍රාත් කළමණාකරනය ඇතුළු කොන්ත්‍රාත් සමාප්තිය දක්වා ක්‍රියාදාමය ඒ ඒ ප්‍රසම්පාදන ආස්ථිත්වය යටතේ මූල්‍ය ඒකකයක යටතේ ද, පවත්වාගත යුතුය.

06. ප්‍රසම්පාදනයේ පිරිවැය වටිනාකම මිලියන දහයට වැඩිවන සෑම ප්‍රසම්පාදනයකට අදාළවන ප්‍රසම්පාදන කමිටුවක් පත් කිරීමේ දී, ඊට සමගාමීව අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නියාමනය සඳහා ආස්ථිත්වයට පරිබාහිර වූ සාමාජිකයින් තිදෙනෙකුගෙන් යුත් කමිටුවක් ආස්ථිත්වය විසින් පත්කළ යුතුය.

07. (1) අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදනයට අදාළ නොවන එහෙත් ප්‍රසම්පාදනයේ සමස්ත පිරිවැය වටිනාකම මිලියන දහයට වැඩි සෑම ප්‍රසම්පාදනයක් සම්බන්ධයෙන්ම ප්‍රසම්පාදන ආස්ථිත්වය විසින් ප්‍රසම්පාදනයට අදාළව පහත සඳහන් කරුණු පිළිබඳව බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත කරුණු වාර්තා කර, ලංසු කැඳවීමට පූර්වයෙන් ඒ සඳහා අනුමැතිය ලබා ගත යුතු ය.

(අ) අදාළ ප්‍රසම්පාදනය සඳහා ප්‍රතිපාදන සකස් වී ඇති ආකාරය.

(ආ) වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්මට අනුකූල බව.

(ඇ) යෝජිත ප්‍රසම්පාදන ක්‍රමය.

(ඈ) ප්‍රසම්පාදනය අදාළ වනුයේ ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් නම්, එම ව්‍යාපෘතිය සම්බන්ධව ශක්‍යතා අධ්‍යයනය නිමකර ඇති බවට සහ ව්‍යාපෘතිය සාර්ථකව නිම කිරීමට අදාළ සියලු කරුණු සම්පූර්ණ වී ඇති බව.

(2) පළාත් අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදනයට අදාළ වන ප්‍රසම්පාදනයක් වන විට ඉහත (1) උපවගන්තිය යටතේ වූ කරුණු සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් පළාත් අමාත්‍ය මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කළ යුතුය.

08. ප්‍රසම්පාදනය සිදු කිරීමේ අත්‍යාවශ්‍යතාවය පිළිබඳ ප්‍රධාන ලේකම් වෙත කරුණු ඉදිරිපත් කර, ඒ සඳහා ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබා ඇත්තේ නම් මිස, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මට පරිබාහිර වූ ප්‍රසම්පාදනයක් කිසිදු ප්‍රසම්පාදන ආස්ථිත්වයක් විසින් නොකළ යුතුය.

09. ප්‍රසම්පාදනය සඳහා ගෙවීමකට අදාළ සෑම බිල්පතක් සම්බන්ධයෙන්ම අදාළ ගෙවීම් කිරීමට පූර්වයෙන් ආස්ථිත්වය විසින් ඒ සඳහා නම්කළ පාර්ශවයන් විසින් අදාළ ගෙවීම් පිරිවිතරයන්ට, ඇස්තමේන්තුවට හා ප්‍රසම්පාදනයට අදාළ ගිවිසුමට සියලු ආකාරයෙන් අනුකූලබවට සහතික කර තිබිය යුතුය.

10. (1) එක් එක් ප්‍රසම්පාදන ආස්ථිත්වය යටතේම ප්‍රසම්පාදනය ක්‍රියාවලියට අදාළ සෑම නිලධාරියෙකු විසින්ම පහත කරුණු සම්බන්ධයෙන් ප්‍රසම්පාදන ආස්ථිත්වය වෙත වගකිව යුතුය.

(අ) ප්‍රසම්පාදනයෙහි සෑම පියවරක්ම මෙම රීති හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූල බවට ;

(ආ) ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළ වන සියලුම පාර්ශවයන් සමග අවශ්‍ය සන්නිවේදන සම්බන්ධතා පවත්වාගෙන යන බවට ;

(ඇ) ප්‍රසම්පාදන සඳහා පූර්ව සුදුසුකම් පරීක්ෂා කිරීම අදාළ වන විට දී, ඊට අදාළ ආරාධනා සකස් කිරීම, සමාලෝචනය කිරීම, අනුමත කිරීම සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටු සම්බන්ධීකරණය කිරීම ;

(ඈ) පිරිවිතර හා ලංසු ලේඛණ කෙටුම්පත් කිරීම, සමාලෝචනය කිරීම සම්බන්ධව තාක්ෂණික ඇගයීම කමිටු සම්බන්ධීකරණය කිරීම ;

(ඉ) ඇගයීම් වාර්තාව සඳහා දත්ත හා තොරතුරු සම්පාදනය.

(ඊ) ලංසු කැඳවීම ආරාධනා කිරීම ;

(උ) ප්‍රසම්පාදන කමිටු, තාක්ෂණික ඇගයීම් කමිටු, රැස්වීම සඳහා පහසුකම් සැලසීම හා ඊට අදාළ වාර්තා බෙදා හැරීම ;

(ඌ) ප්‍රසම්පාදන කමිටු, තාක්ෂණික ඇගයීම් කමිටු ඉල්ලීම සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීම.

(2) එක් එක් ප්‍රසම්පාදන ආස්ථිත්වය යටතේ ප්‍රසම්පාදනයට ගෙවීම් ක්‍රියාවලියට අදාළ සෑම නිලධාරියකු විසින්ම පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ප්‍රසම්පාදන ආස්ථිත්වය වෙත වගකිව යුතුය.

(අ) ප්‍රසම්පාදනයේ කොන්ත්‍රාත් ප්‍රදානය සිට කළමනාකරණය ඇතුළු කොන්ත්‍රාත් සමාප්තිය දක්වා ක්‍රියාදාමය නිසියාකාරව සිදුකර ඇති බවට සෑහීමට පත්විය හැකි තරමට කරුණු ඉදිරිපත් වී ඇති බවට.

(ආ) ගෙවීම් හා අදාළ වන කොන්ත්‍රාත්තුවෙහි නිමවීම් නියමානුකූල බවට නිසි අධිකාරිය විසින් සහතික වී ඇති බවට.

(ඇ) ගෙවීමට අදාළ වියදම කොන්ත්‍රාත්තුවට අදාළ ගිවිසුමට ඇතුළත් පිරිවැය ඇස්තමේන්තුවට අනුකූල බවට.

(ඈ) අදාළ ගෙවීම් ගිවිසුමෙහි සඳහන් කොන්දේසිවලට අනුකූල බවට.

11. මෙම රීති යටතේ කරනු ලබන ප්‍රසම්පාදනයට අදාළව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා නියමයන් හා ඊට අදාළව කලින් කල නිකුත් කරන උපදෙස්, නියම කරන ලද ආකෘති, එක් එක් ප්‍රසම්පාදන කමිටු වෙත අදාළ කර ගත යුතු මූල්‍ය සීමාවන් ආදී කරුණු ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට යටත්ව අවශ්‍ය සංශෝධන සහිතව අදාළ විය යුතුය.

12. බස්නාහිර පළාත් සභා අරමුදලින් හා ඒ අරමුදලින් මුදල් විසර්ජනය වන බස්නාහිර පළාත් සභාව යටතේ වන ව්‍යවස්ථාපිත අධිකාරීන් සිදු කරන සෑම ප්‍රසම්පාදනයකට අදාළ වන කොන්ත්‍රාත් ප්‍රදානයන් සම්බන්ධයෙන් වූ තීරණයකට අදාළව අතෘප්තියට පත්වන අයගේ අභියාචනා, රජයේ ප්‍රසම්පාදන නියමයන්ට අනුකූලව ආණ්ඩුකාරවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, එසේ ඉදිරිපත් වන අභියාචනා ආණ්ඩුකාරවරයා විසින් ඒ සඳහා නිශ්චිතව පත්කර ඇති මණ්ඩලයක නිරීක්ෂණ සැලකිල්ලට ගෙන විසඳිය යුතුය. තවද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන නියමයන් යටතේ අභියාචනා සම්බන්ධයෙන් වන සියලුම විධිවිධාන මෙම වගන්තියෙහි විධිවිධානයන්ට යටත්ව සැලකිල්ලට ගත යුතුය.

13. මෙම රීති යටතේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයන් අවශ්‍ය වුවහොත් මිස ;

"පළාත" යන්නෙන් බස්නාහිර පළාත ද,

"ආණ්ඩුකාරවරයා" යන්නෙන් බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයා ද,

"ප්‍රධාන ලේකම්" යන්නෙන් බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් ද,

"ප්‍රධාන ගණන් දීමේ නිලධාරී" යන්නෙන් බස්නාහිර පළාත් මූල්‍ය රීති සංග්‍රහය යටතේ දී ඇති අර්ථයම ද,

"ගණන් දීමේ නිලධාරී" යන්නෙන් බස්නාහිර පළාත් මූල්‍ය රීති සංග්‍රහය යටතේ දී ඇති අර්ථයම ද,
අදහස් වෙයි.

14. මෙම රීති යටතේ සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ පාඨ අතර අනනුකූලතාවයක් හටගතහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වෙයි.

08 - 309

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.